# 1.0. අධ්‍යයනය හැඳින්වීම

## 1.1. පර්යේෂණ මාතෘකාව (Research Topic):

සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා පිළිබඳ අධ්‍යයනය

## 1.2. පර්යේෂණ මාතෘකාව හැඳින්වීම (Introduction):

"කලාව වූ කලී එක් අයෙකු සිතා මතා යම් යම් බාහිර සලකුණු උපයෝගී කරගෙන අන්‍යයන් ආසාදනය වන සේ ස්වකීය වේදිතයන් අන්‍යයන් තුළ ජනිත කරවන මානව ක්‍රියාවලියක් වශයෙන් සඳහන් කළ හැකිය" (තෝල්ස්තෝයි, 1995). ඒ අනුව ආනන්දයෙන් ප්‍රඥාව කරා යන කලා මාධ්‍ය තුළ පවතින සෞන්දර්යාත්මක ගුණය හෝ කලා රසය විඳගැනීමේ ශක්තිය ඇති සත්වයා වන්නේ මනුෂ්‍යයා ය. මන්ද ඒ සඳහා මනසින් උසස් විය යුතු බැවිනි. සුන්දර වන්නේ සප්‍රයෝජන දේය. සුන්දර වන්නේ ඇසීම හා දැකීම තුළින් සුඛාස්වාදයක් ගෙන දෙන දේය. යනුවෙන් ප්ලේටෝ සඳහන් කරයි. ඒ අනුව ඇතැම්විට "සෞන්දර්යය යනු සප්‍රයෝජන ප්‍රීතිය විය හැකිය" (ගම්ලත්, 1997). කලාව නම් වූ ප්‍රතිනිර්මාණය හා බැඳුණු මෙම ක්‍රියාවලිය තුළ කලාව වශයෙන් හඳුනාගත හැකි වන්නේ ගල් යුගයේ සිට ජනකවි, ගීතය, සංගීතය, නාට්‍ය, සිනමාව, චිත්‍ර හා නවකතා, කෙටිකතා ආදිය වශයෙන් පෙන්වාදිය හැකිය. මෙම කලාව තුළින් ද දැකිය හැකි වන්නේ සන්නිවේදනය ක්‍රියාදාමයයි. මේ ආකාරයට මුල් මිනිසා ශබ්ද හා රූප වශයෙන් සංඥා හා සංකේත යනාදිය නිපදවාගෙන එමගින් සතුට, දොම්නස හා වීරත්වය යනාදිය වැඩි වශයෙන් ප්‍රකට කරමින් සන්නිවේදනයෙහි යෙදී ඇත. "ඒ අනුව මානව සමාජයේ පැවැත්ම හා ඉදිරි පියවර සඳහා සන්නිවේදනය ඉතා ප්‍රබල අයුරින් බලපාන බව සියලු ජනමාධ්‍ය විද්වතුන්ගේ මතය වේ. ඒ සම්බන්ධයෙන් ප්‍රවීණ ජනමාධ්‍ය ආචාර්යවරයෙකු වන විල්බර් ශ්‍රාම් සිය ග්‍රන්ථයක මෙසේ සඳහන් කරයි. සන්නිවේදකයින්ගෙන් තොරව මානව කණ්ඩායම් හි සහ මානව සමාජයන් හි පැවැත්මක් නැත" (ගුණසේකර, 2015, පි.12). යම්කිසි කලාවක් ලෙස නිර්මාණය වූ ශබ්ද සන්නිවේදනය මෙහිදී වැදගත් වේ. වචන නිර්මාණය කරගැනීමත් විවිධ භාෂාවන් බිහිකරගැනීමත් ශබ්ද සන්නිවේදනයේ කැපීපෙනෙන සිද්ධස්ථානයන් ය. ශබ්ද සන්නිවේදනයේ උපරි ඵලය වන්නේ ගුවන්විදුලියයි. ගුවන්විදුලියේ පැවැත්ම රඳා පවතින්නේ මූලික වශයෙන් හඬ පදනම් කර ගැනීමෙනි.

ගීත ශානරය යන්න පිළිබඳව විමර්ශනය කිරීමේදී එක් එක් ආකෘතිකගතව සියලු ගීත ඊට අයත් බව පෙන්වා දිය යුතුය. එහිදී ගීතයෙහි පවතින විශ්වීය හා කලාත්මක වැදගත්කම පිළිබඳව පරීක්ෂා කිරීමේදී ගීතය තුළින්ද යම්කිසි ආකාරයක සන්නිවේදන ක්‍රියාදාමයක් සිදුවන බව පෙන්වා දිය යුතුය. ඒ අනුව ගීතයක් යනු සන්නිවේදන මාධ්‍යයක් වන අතර එම ගීතයෙහි ඇති අර්ථාන්විත බව විවිධ ස්වරූපගතව ක්‍රියාත්මක වීම දක්නට හැකිය. ඒ අනුව පැහැදිලි වන කරුණ වන්නේ ගීතයක් සන්නිවේදන මාධ්‍යයක් ලෙස ගත් කළ ඒ තුළ සමාජයීය වශයෙන් දෙනු ලබන යම්කිසි අර්ථයක්, එම අර්ථයත් සමග බද්ධ වූ අදහසක් පවතී. මෙහිදී මෙම අධ්‍යයනය මගින් සාකච්ඡාවට භාජනය කරනු

ලබන සුභාවිත ගීතය තුළ ප්‍රබල ලෙසම එහි පවතින අර්ථය හා අදහස ගැබ්ව පැවතීම සුවිශේෂීව පෙන්වා දිය යුතුය. එය සුභාවිත ගීතයේ පවතින සන්නිවේදන විශේෂතාවක් ලෙස දක්වාලිය හැකිය.

මෙහිදී මෙම අධ්‍යයනය තුළින් අවධානය යොමු වන සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේදන විශේෂතා පිළිබඳ අධ්‍යයනය කිරීම වැදගත් වන්නේ භාෂාවේ මුල්ම ව්‍යුහාත්මක ස්වරූපය හඬ හෙවත් ශබ්දය බවට පත්වීමත් සමග ගුවන්විදුලිය ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් ලෙස තහවුරු කිරීමට හේතුකාරක වූ මුල්ම සාධකය භාෂාව බවට පත්වීමත් සුභාවිත ගීතය නම් සංගීතය, හඬ හා භාෂාව මත පදනම් වූ කලාංගයක් ගුවන්විදුලි මාධ්‍ය සමග පවතින අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය තුළ පවත්නා වූ සහසම්බන්ධතාවය විමර්ශනය කිරීමත් නිසාවෙනි. ඊට අමතරව අද්‍යතනය වනවිට සියලු ජනමාධ්‍යයන්ගේ නැගීම හා ප්‍රභවය ඉතා ප්‍රබල තත්වයකට පත්ව තිබෙන බව ඉතා පැහැදිලි වන අතර අද ලෝකය එක් යායක් බවට පත්ව තිබෙන්නේ විශේෂයෙන්ම විද්‍යුත් ජනමාධ්‍යයේ විප්ලවීය සංවර්ධනය හේතුකොටගෙනය. එමෙන්ම ලෝකයේ විවිධ රටවල ක්‍රියාවට නැඟෙන සංවර්ධන ක්‍රියාදාමයට දායක වී සිටින මාධ්‍යයන් රැසක් අතර ගුවන්විදුලි මාධ්‍යයට හිමිවන්නේ වැදගත් හා සුවිශේෂී ස්ථානයකි. ඒ අනුව සන්නිවේදන ක්‍රියාවලිය මානව සබඳතා සමග කොතරම් තදින් බද්ධ වී තිබේද යන්න පහසුවෙන් අවබෝධ කරගත හැකිය. වර්තමානය වනවිට ජනසන්නිවේදන මාධ්‍ය අධ්‍යයන විෂයක් ලෙසට ඉතා යුහුසුලුව වර්ධනය වෙමින් පැවතීම නිසාවෙන් විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයට පිවිසෙන ආධුනිකයන්ගේ සංඛ්‍යාව ද ඉහළ අගයක් ගනු ලබයි. විශේෂයෙන්ම ගුවන්විදුලි මාධ්‍ය න්‍යායාත්මකව හා ප්‍රායෝගික ශික්ෂණයක් ලෙසට ප්‍රගුණ කළ යුතු සැබෑ අන්දම ආධුනික මාධ්‍යවේදීන්ට තුලනාත්මකව පහදාදීම හා සමාජ ප්‍රගමනයට හේතුවන දේශානුරූපී හා ගුණාත්මක ගුවන්විදුලි මාධ්‍යයක් ගොඩනැගීම කාලෝචිත වේ. තවද ජනතාවගේ රුචිකත්වය හා වින්දන ශක්තිය උසස් මට්ටමකට ගෙන ඒම වෘත්තීය මාධ්‍යවේදියාගේ මූලික වගකීමක් වන අතර විද්‍යුත් ජනමාධ්‍ය හා පරිභෝජනයෙහි සිදුවී ඇති පරිවර්තන හේතුකොටගෙන කෘතීම සමාජයන් බිහිවීම වෙනුවට ගුණාත්මක හා උසස් මාධ්‍ය කලාවක් ගොඩනැගීම මාධ්‍යවේදීන්ගේ යුතුකම හා වගකීම වේ. මෙම අධ්‍යයනයෙහි පවතින කාලීන හා ජාතික වැදගත්කම සේම විෂයානුබද්ධ සම්බන්ධතාවය එලෙස අර්ථ දැක්විය හැකිය.

එය තවදුරටත් ඉදිරියට යමින් ගීතය පිළිබඳව අර්ථ දැක්වීමේදී ගීතය වූ කලී රසය ආත්මය කොට ගෙන ඇති වාක්‍යයයි. ඩබ්. ඩී. අමරදේව සූරීන් ලොව බිහිවන ගීත ප්‍රධාන ක්‍රම තුනකට වර්ග කරනු ලබයි. එනම්,

1. සුභාවිත ගීත (Art Song)

2.ජනප්‍රිය ගීත (Popular Song)

3. ජන ගීත (Folk Song) යනුවෙනි.

මෙහිදී අවධානය යොමු කරන සුභාවිත ගීතය යනු සංකීර්ණ ගණයෙහි ලා ගැනෙන ගීත විශේෂයක් වන අතර එහි ආකෘතිය ජන හා ජනප්‍රිය ගීතවලට වඩා බෙහෙවින් ශාස්ත්‍රීය තත්වයක් ප්‍රකට කරයි. 18 වන සියවසේදී උඩරට රජ වාසල තුළට පැමිණි බාලිවාලා නාට්‍යයෙන් හඳුන්වාදුන් නූර්ති ගීයෙන් හමාර ව නූතන යුගයේ සිංහල ගීතයේ ආරම්භය තාගෝර් ගීතයෙන් ඇරඹී 50 දශකය අග භාගය වනවිට අමරදේව වැනි විශිෂ්ටයින්ගෙන් ප්‍රමිතිගතව පෝෂණය විය. අද්‍යතන ගීතය නමින් හැඳින්වෙන කලා මාධ්‍යය ඊටම ආවේණික වූ ස්වතන්ත්‍රයක් බවට පත්වූ නව කලා මාධ්‍යයකි. ශ්‍රව්‍ය ගෝචර කලාවක් වශයෙන් වර්ධනය වී ඇති මෙම මාධ්‍යයේ සීමා හා සුවිශේෂීතා හඳුනාගැනීම සිදු කළ හැක්කේ ඒ පිළිබඳ බොහෝ සියුම් සංවේදීතාවයක් ඇත්තෙකුට පමණි.

ඒ අනුව පුද්ගලික රසඥතාවය උදෙසා බිහිව ඇති ප්‍රකට මාධ්‍යයක් වන සංගීතය සතුව පවතින මානව හැඟීම ආමන්ත්‍රණය කිරීමේ ශක්‍යතාවය ප්‍රබල වේ. මානවයා එකිනෙකා අතර සන්නිවේදනය ආරම්භ කරන ලද දිනයේ සිට එවැනිම වූ පරිමාණක සබඳතාවයක් සංගීතය කෙරෙහි ද දක්වන ලද අතර සංගීතයේ අග්‍ර ඵලයක් ලෙස බිහිවූ ගීත කලාව තුළ සිංහල සුභාවිත ගීත කලාව හඳුනාගැනීම හා ඒ වෙනුවෙන් නූතන ගුවන්විදුලි නාලිකා තුළ  පවතින්නාවූ  ඉඩ ප්‍රස්ථාව විමසා බැලීම සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා පිළිබඳ අධ්‍යයනය නම් මෙහිදී අරමුණු කරගනු ලබයි.

ගුවන්විදුලිය යනු මානව ඉතිහාසය ඇරඹීමෙන් අනතුරුව විවිධ ස්වරූපයෙන් හා හැඩයෙන් දියුණු වෙමින් පැවති සන්නිවේදන ක්‍රම අතර ගෝලීයකරණය හා විශ්ව ගම්මාන සංකල්පයෙහි ආගමනයත් සමග තාක්ෂණයෙහි දියුණුවෙන් දශක දෙකකටත් අඩු කාල පරාසයකදී පුළුල් මාධ්‍යයක් ලෙස ලොව පුරා ව්‍යාප්ත වූ ප්‍රබල සන්නිවේදන මාධ්‍යයකි. මෙය රූපවාහිනී මාධ්‍යයෙහි ආගමනයත් සමග යම් බලපෑමකට ලක් වුව ද භාෂාව ග්‍රහණය කරගැනීමේ හැකියාව ඇති සෑම අයෙකුටම මේ ඔස්සේ සංදේශ ග්‍රහණය කරගැනීමට හැකිවීම මෙහි ඇති සුවිශේෂී ලක්ෂණය වේ. "සාක්ෂරතාවයෙන් තොර ග්‍රාහක කොට්ඨාස කෙරෙහි ගුවන්විදුලි මාධ්‍ය දක්වන සමීපත්වය ඉතා ප්‍රබලය. මාධ්‍ය භාවිතය සඳහා අසන්නා හෙවත් ග්‍රාහකයාට විශේෂ පුහුණුවක් හෝ දැනුමක් හෝ අවශ්‍ය නොවීම ද මෙම මාධ්‍යයේ ඇති තවත් සුවිශේෂී ලක්ෂණයකි" (ගුණසේකර, 2015, පි.24). ගුවන්විදුලි වැඩසටහන් විවිධ අරමුණු ඔස්සේ පෙළගැස්වූවද එහි මූලිකම අරමුණ වන්නේ විනෝදාස්වාදය ලබාදෙමින් ශ්‍රාවක ආකර්ෂණය දිනාගැනීම වන අතර අද්‍යතනයේදී ගුවන්විදුලිය හා ජනතාව බැඳ තබන මූලික මෙන්ම වැදගත් ම සාධකය වන්නේ ඒ තුළ සංගීත රසාස්වාදන අවකාශය වේ. ඒ අනුව මෙරට පොදු ජනතාව සංගීතය රසවිඳිනු ලබන්නේ ගීතය පදනම් කොටගෙන හේතුවෙන් අද්‍යතන ගීතය ග්‍රාහකයා සමග අතිශය සමීප  සබඳතාවයකට පාත්‍ර වූ කලාංගයකි.

ගීත පෙළගැස්ම යන්න අධ්‍යයනය කිරීමේදී සෑම ගුවන්විදුලි නාලිකාවක්ම ඊට අනන්‍ය වූ ක්‍රමවේදයකට අනුකූලව සැකසීම සිදුකරයි. ගුවන්විදුලි සංස්ථාව සිංහල සරල ගීතයෙහි තිඹිරිගෙය වීම හා ඒවායින් තෝරාගත් ගීත තැටිගත කර නැවත ප්‍රචාරය වීම තුළින් පැරණි සිංහල ගීතය බිහිවූවත් පෞද්ගලික නාලිකා විසින් පෞද්ගලික ගීත නිෂ්පාදනය කර ප්‍රචාරය කිරීම හා මුළුමනින්ම ගීතය සඳහාම පමණක් වෙන්වූ නාලිකා ද බිහිවීම සිදුවිය. අද්‍යතනය වනවිට මෙම ගුවන්විදුලි නාලිකා පූර්ව

සූදානමක් සහිත ගීත ලැයිස්තු තම ගුවන් කාලය තුළ ප්‍රචාරය කරමින් ආර්ථිකමය ප්‍රතිලාභ අපේක්ෂාවෙන් විශාල ශ්‍රාවක පිරිසක් තමන් වෙත නතු කරගැනීම තුළ එම ගුවන්විදුලි නාලිකාවන්හි ප්‍රබලත්වය හේතුවෙන් අවරගනයේ ඇතැම් ගීත ඉහළ ජනප්‍රියත්වයක් ලබාගැනීම මෙහිදී දැකිය හැකිය.

සන්නිවේද්‍ය හා සන්නිවේදනය පිළිබඳව අර්ථ දැක්වීමේදී සන්නිවේදනයෙහි පැතිකඩ ද්විත්වයකි. එනම් සන්නිවේදන යාන්ත්‍රණය හා සන්නිවේදනය වේ. සන්නිවේද්‍ය යනු ගීතය තුළ පවතින අර්ථයයි. ඒ අනුව ගීත්යාකින් යම්කිසි අදහසක් ලබාදීමට සන්නිවේදනය අවශ්‍ය බව මෙහිදී වැටහෙන කරුණකි. එහෙත් ගීතයක අර්ථය තුළින් සමාජගත කරනුලබන උපදේශාත්මක වටිනාකම අද වනවිට යම් පරිහානියකට පත්ව තිබේ. විවිධ ආකෘතිකගත ගීත තිබුණ ද , ගුවන්විදුලි නාලිකා පෞද්ගලික හා රාජ්‍ය වශයෙන් පැවතුණ ද, එම රාජ්‍ය හා පෞද්ගලික නාලිකාවන්හි විවිධ වැඩසටහන් ආකෘතීන් තිබුණ ද ඒවා තුළින් ප්‍රචාරය කරනු ලබන ගීතයේ අර්ථය හා හරය මේ වනවිට ලඝු වී ඇත. එය යම්කිසි ආකාරයකට ගීත අවම තත්වයක් ලෙස දර්ශනය වේ. මෙය ගැටලුකාරී තත්වයකි. ඒ අනුව එය විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම වැදගත් වන බව පෙන්වා දිය යුතුය.

සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා නම් මෙම පර්යේෂණය සඳහා මෙම මාතෘකාව තෝරාගැනීමේ වැදගත්කම පිළිබඳව පෘථුලව සාකච්ඡා කිරීමේදී පෙන්වා දිය හැකි මුඛ්‍ය කරුණ වන්නේ ගුවන්විදුලිය පිළිබඳවත්, ගුවන්විදුලි වැඩසටහන් ආකෘති පිළිබඳවත්, ගුවන්විදුලි සංගීත වැඩසටහන් යනාදිය පිළිබඳවත්, ගුවන්විදුලි ගීතය පිළිබඳවත් කොතෙකුත් අධ්‍යයනයන් ජාතික වශයෙන් ද ජාත්‍යන්තර වශයෙන්ද සිදුවී තිබුණ ද ගීත ශානරයක පවතින සන්නිවේද්‍ය විශේෂතා පිළිබඳව පිළිබඳව විමර්ශනය කිරීමත්, විශේෂයෙන්ම ගුවන්විදුලි ගීත ශානරයක සන්නිවේද්‍ය විශේෂතා විමසීම අතිශය විරල මට්ටමක පැවතීමයි. ගෝලීයකරණය සංකල්පයේ ව්‍යාප්තියත්, මාධ්‍ය සංස්කෘතියෙහි බිහිවීමත් සමග සංහතික මාධ්‍ය තුළ පවතින්නා වූ සංකීර්ණත්වය හේතුවෙන් තාක්ෂණිකමය වශයෙන් සිදුවූ විපර්යාසයන් මෙන්ම න්‍යායානුකූලව ද වෙනස්කම් රාශියක් සිදුවීම වැඩසටහන් අන්තර්ගතය හා ආකෘතීන් කෙරෙහි ද බලපෑමක් සිදු කර ඇත. එහිදී විශේෂයෙන්ම ගුවන්විදුලි සංගීතය තුළ සිදු වූ උඩුයටිකුරු බව පෙන්වා දිය යුතුය. මක් නිසාද යත් ගුවන්විදුලි සංගීතය තුළ එදා ගුවන්විදුලි සංස්ථාව ඔස්සේ ඉදිරිපත් කරන ලද සාරවත් හා හරවත් බව අද්‍යතනය වනවිට වියැකී යාම හේතුවෙනි.

එදා ගීත ශානරයක් තුළ සුභාවිත ගීතය තුළින් සිදු කළ කලාත්මක හා විශ්වීය කාර්යභාරය අද්‍යතනය වනවිට දක්නට නොලැබීම මෙහිදී පෙන්වා දිය යුතු කරුණකි. නැවත සමකාලීන ගුවන්විදුලිය තුළ එය ස්ථාපනය කිරීමට පියවර ගැනීම සඳහා මෙවැනි විශ්ලේෂණාත්මක අධ්‍යයනයන් සිදු කිරීම ශාස්ත්‍රීය වශයෙන් ඉතා වැදගත්කමක් දක්වන බව පෙන්වා දිය යුතුය. එමෙන්ම මෙහිදී පෙන්වා දිය හැකි දෙවන කරුණ වන්නේ සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා මෙන්ම මාධ්‍යයට මෙන්ම සන්නිවේදනයට පවතින්නා වූ සම්බන්ධයි. මෙහිදී ගීතය හා මාධ්‍ය අතර පවතින සම්බන්ධතාවය පිළිබඳව අදහස් දැක්වීමේදී ගීතය යනු ශබ්ද මාධ්‍ය තුළින් පියවරෙන් පියවර ආරම්භ වූ සන්නිවේදන මාධ්‍යයක් වීම පෙන්වා දිය යුතුය. තව ද ගුවන්විදුලි මාධ්‍ය ගීතය මගින් සිදුකළ පෙරළිය සන්නිවේදනාත්මක පෙරළියක් වීම වේ. එහෙත් අද්‍යතනය වනවිට ගුවන්විදුලි මාධ්‍ය තුළ සන්නිවේද්‍ය

විශේෂතාවන් බවට පත්ව තිබූ ගුවන්විදුලි ගීතයට විශේෂිත වූ සුභාවිත ගීතයෙහි පැවැත්ම අභියෝගයට ලක්වී තිබීම මෙන්ම දැනට ගීතයෙන් ලබාදෙන්නා වූ සන්නිවේදා හෙවත් ගම්‍ය වන අර්ථය බොහෝ ගැටලුකාරී වී තිබීමයි. එම නිසා මේ සඳහා අධ්‍යයනය සිදු කිරීම තුළින් ලබාගන්නා ලද විශ්ලේෂණාත්මක මෙන්ම න්‍යායාත්මක විසඳුම්වල අවශ්‍යතාවයක් පවතිනු ලබයි.

මෙම අධ්‍යයනය සිදු කිරීම සඳහා පවතින ජාතික මෙන්ම කාලීන වැදගත්කම අතර ප්‍රථමයෙන් හඳුන්වා දිය යුතු කරුණ වන්නේ නව ලිබරල් ආර්ථික සංස්කෘතික ප්‍රතිසංස්කරණ තත්වයන් සමග එම වපසරිය තුළ ගීතය යන්න සම්පූර්ණ වශයෙන් උඩු යටිකුරු වී තිබීමයි. එම වෙනස්කම් සමග එය සුභාවිත ගීතයට, එහි සන්නිවේදා කාර්යයට නැතහොත් අර්ථයට මෙන්ම, ගීතය හා සබැඳි මිනිසුන්ගේ රසවින්දන කාර්ය සඳහා ගැටලුකාරී තත්වයක් පැනනැගී ඇති සේම විශාල තර්ජනයක් එල්ල වී ඇත. මෙවැනි යුගයක මෙවැනි අධ්‍යයනයක් සිදු කිරීමේ කාලීන මෙන්ම ජාතික අවශ්‍යතාවය වන්නේ සුභාවිත ගීතයට එල්ල වී ඇති අභියෝග පිළිබඳව විමසා බලා එයට අවශ්‍ය පියවර ගැනීම සඳහා සිදුකළ යුතු න්‍යායාත්මක සම්පාදනය විධිමත් අයුරින් සැකසිය යුතු වීමයි. එය සුවිශාල වැදගත්කමකි.

මෙම අධ්‍යයනය සිදුකිරීමේ පෙන්වා දිය යුතු තවත් මූලික වැදගත්කම හා කාලෝචිත බව සනාථ කිරීමේදී ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ගුවන්විදුලි මාධ්‍ය පිළිබඳවත් ජාතික වශයෙන් සම්භාව්‍ය සංගීතය, ජන සංගීතය, සුභාවිත සංගීතය මුඛ්‍ය කොටගත් ගීත කලාව පිළිබඳවත් ලිපි, පාඨ ග්‍රන්ථ, පර්යේෂණාත්මක රචනා, පොත්පත් කොතෙකුත් වෙන් වෙන් වශයෙන් ලියවී තිබුණ ද මෙම ක්ෂේත්‍ර ද්විත්වය පිළිබඳව එක් පර්යේෂණ විග්‍රහයක යෙදී ඇති අධ්‍යයනයන් ඉතා විරල මට්ටමක පැවතීම පෙන්වා දිය හැකිය. ඒ අනුව මෙම අධ්‍යයනය සිදු කිරීමේදී මූලික වශයෙන් එම මූලාශ්‍රයන් පරිශීලනයට යොදාගත් අතර 2007 වර්ෂයේදී ලලිත් ප්‍රියදර්ශන දයාරත්න විසින් රචනා ලකරන ලද ගී රස විනිස, 2008 වර්ෂයේදී ඉරංගා සමින්දනී වීරක්කොඩි විසින් රචිත ගුවන්විදුලිය සහ සංගීතය, 2012 වර්ෂයේදී තිස්ස කාරියවසම් විසින් රචනා කරන ලද ගුවන්විදුලි මාධ්‍ය යනු කෘතිය ද, නිව්ටන් ගුණසේකර විසින් 2015 වර්ෂයේදී රචනා කරන ලද ගුවන්විදුලිය හා මාධ්‍ය අධ්‍යයනය, එම වර්ෂයේදීම කළණි ඉරෝෂා ධර්මසිරි විසින් රචිත ගුවන්විදුලි මාධ්‍ය වැඩසටහන් නිෂ්පාදන ප්‍රවේශය හා සජිතා ලක්මාලි විසින් රචිත ඩිජිටල් යුගය අභියස ගුවන් විදුලියේ ඉරණම යනාදී ග්‍රන්ථයන් මෙම පරිශීලන ග්‍රන්ථ අතර ප්‍රමුඛස්ථානයක් ගනු ලබයි. මෙම අධ්‍යයනයේදී මූලික වශයෙන් සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේදා විශේෂතා පිළිබඳ න්‍යායාත්ම විශ්ලේෂණය හා හඳුනාගැනීම,

සිංහල ගීත කලාව තුළ සුභාවිත ගීතය හඳුනාගැනීම, සමකාලීන ගුවන්විදුලි ගීත ශානර පද්ධතිය තුළ සුභාවිත ගීතය පිළිබඳව පවතින න්‍යායික සහ සංකල්පීය ප්‍රවේශ පිළිබඳව විමර්ශනය කිරීම, ගුවන්විදුලියේ ප්‍රචාරය වනු ලබන ගීත ශානර අතර ප්‍රමුඛව ඉඩ ප්‍රස්ථාව ලබාදෙන ගීත වර්ග හඳුනාගැනීම හා එයට අදාළ හේතු සහ කොන්දේසි විමර්ශනය කිරීම, සමකාලීන ගුවන්විදුලි ගීත ශානර ව්‍යුහය තුළ සුභාවිත ගීතයේ තත්වය විමසා බැලීම, යන්න හා එහිදී ශ්‍රාවක පිරිස අතරින් තරුණ

ප්‍රජාවගේ ආකල්ප වර්ධනය සඳහා සුභාවිත ගීතය මගින් කරනු ලබන බලපෑම කුමනාකාරද යන්න ප්‍රශස්ත ලෙස  අධ්‍යයනය කිරීම සිදුකරනු ලබයි.

## 1.3. පර්යේෂණ ගැටලුව (The Statement of the Research Problem):

සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා පිළිබඳ අධ්‍යයනය කරනු ලබන මෙහි පර්යේෂණ ගැටලුව නූතන ගුවන්විදුලි නාලිකාවල ඇති ගීත පෙළගැස්ම තුළ සුභාවිත ගීතයට ලබා දී ඇති ඉඩ ප්‍රස්ථාව කුමක්ද ? යන්නයි.

## 1.3.1 පර්යේෂණ ගැටලුව හැඳින්වීම (Introduction of the Research Problem):

සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා පිළිබඳ අධ්‍යයනය යන  මෙම පර්යේෂණාත්මක විග්‍රහයේදී නූතන ගුවන්විදුලිය තුළ සුභාවිත ගීතයට ලබාදී ඇති ඉඩ ප්‍රස්ථාව කුමක්ද? යන පර්යේෂණ ගැටලුව මුඛ්‍ය කොට ගනිමින් නූතන ගුවන්විදුලි නාලිකාවල ඇති ගීත පෙළගැස්ම තුළ සුභාවිත ගීතයට ඉඩ ප්‍රස්ථාවක් ලබාදී තිබේද? එය කෙතරම් ද? හා එම අවස්ථාවන් මොනවා ද? යන්න පිළිබඳව විශ්ලේෂණය කරනු ලබයි.

## 1.4. පර්යේෂණ උපන්‍යාසය (Hypothesis of the Research):

සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා පිළිබඳ අධ්‍යයනය යන මෙහි නූතන ගුවන්විදුලියෙහි ඇති ගීත පෙළගැස්ම තුළ සුභාවිත ගීතයට ඉඩ ප්‍රස්ථාවක් ලබාදී නොමැත යන්න පර්යේෂණ උපන්‍යාසය  වේ.

## 1.5. පර්යේෂණ අරමුණ (Aim of the Research):

සංගීතයේ අග්‍ර ඵලයක් ලෙස බිහිවූ ගීත කලාව තුළ සිංහල සුභාවිත ගීත කලාව හඳුනාගනිමින් නූතන ගුවන්විදුලි ගීත ශානර තුළ සුභාවිත ගීතයේ භූමිකාව විමසා බැලීම අධ්‍යයනය මෙහිදී අරමුණු කරගනු ලබයි.

## 1.6. පර්යේෂණ අභිමතාර්ථ (Objectives of the Research):

1. සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේදය විශේෂතා පිළිබඳ න්‍යායාත්ම විශ්ලේෂණය හා හඳුනාගැනීම.
2. සිංහල ගීත කලාව තුළ සුභාවිත ගීතය හඳුනාගැනීම.
3. සමකාලීන ගුවන්විදුලි ගීත ශානර පද්ධතිය තුළ සුභාවිත ගීතය පිළිබඳව පවතින න්‍යායික සහ සංකල්පීය ප්‍රවේශ පිළිබඳව විමර්ශනය කිරීම.
4. ගුවන්විදුලියේ ප්‍රචාරය වනු ලබන ගීත ශානර අතර ප්‍රමුඛව ඉඩ ප්‍රස්ථාව ලබාදෙන ගීත වර්ග හඳුනාගැනීම හා එයට අදාළ හේතු සහ කොන්දේසි විමර්ශනය කිරීම.
5. සමකාලීන ගුවන්විදුලි ගීත ශානර ව්‍යුහය තුළ සුභාවිත ගීතයේ තත්වය විමසා බැලීම.
6. 1924 වර්ෂයේ සිට අද දක්වා ගීතයෙන් පෝෂණය වන ගුවන්විදුලි නාලිකාවල විකාශනය අධ්‍යයනය කිරීම.
7. තරුණ ප්‍රජාවගේ ආකල්ප වර්ධනය සඳහා සුභාවිත ගීතය මගින් කරනු ලබන බලපෑම කුමනාකාරද යන්න අධ්‍යයනය කිරීම.

## 1.7. අධ්‍යයනයට අදාළ පර්යේෂණයේ වැදගත්කම:

ගීතය යනු සියුම් වූ ද, ප්‍රබල වූ ද භාව ප්‍රකාශන මාධ්‍යයක් මෙන්ම ජනප්‍රියතම ප්‍රාසංගික නිර්මාණයකි. සිංහල ගීතය ද අනෙකුත් සාහිත්‍යාංග මෙන්ම කෙමෙන් පරිණත වෙමින් යුග කිහිපයක් හරහා විකාශනය වූවකි. එහි ප්‍රභවය හා ක්‍රමික විකාශනය පිළිබඳව සලකා බැලීමේදී නූර්ති යුගය සිංහල ගීතයේ මෙන්ම සුභාවිත සංගීතයේ ද ස්වර්ණමය ස්ථානය ලෙසත්, ගුවන්විදුලි ගීතය එහි ප්‍රගමනයෙහි සංදිස්ථානය ලෙසත් හඳුන්වාදිය හැකිය. 1960 දශකයේ දී පමණ සිංහල ගීතය විවිධ අනුභූතීන් ඔස්සේ නව ප්‍රවණතා රැසකට හසුවෙමින් නූතනත්වයට පත්වීමත් සමග එවකට තිබූ සුභාවිත ගීත පවා ලඝු බවට පත්විය. ඒ ආකාරයට පරිණාමයට පත්වෙමින් පැමිණි සුභාවිත ගීතයට නූතන ගුවන්විදුලිය තුළ ලබා දී ඇති ඉඩ ප්‍රස්ථාව ගුවන්විදුලි මාධ්‍යයට විශේෂිතව අධ්‍යයනය කොට එමගින් සිදුවන සමාජ කාර්යභාරය පිළිබඳව යම් නිගමනයන්ට එළඹීම සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේදය විශේෂතා පිළිබඳ අධ්‍යයනය නම් මෙම පර්යේෂණය ඔස්සේ සිදු කරනු ලබයි.

## 1.8. පර්යේෂණ සීමා (Limitation of the Research):

මෙම පර්යේෂණයේ අධ්‍යයන ක්ෂේත්‍රයේ පුළුල් බව නිසා මෙන්ම අධ්‍යයනයේ පහසුව උදෙසා එය ද්විත්වයක් ලෙස බණ්ඩනය කොට ගන්නා ලදී. එනම් විෂය සීමා සහ භූගෝලීය සීමාවන්ට යටත් වශයෙනි.

### 1.8.1. විෂය සීමා (Subject Limitation):

මෙහිදී සංහතික මාධ්‍ය යන පුළුල් සංකල්පය තුළ පවතින ගුවන්විදුලි මාධ්‍ය යන්න තෝරාගනු ලබන ජන ගී, ජනප්‍රිය ගී හා සුභාවිත ගීත යන්න තුළින් සුභාවිත ගීතයට විශේෂිතව අධ්‍යයනය සිදු කරනු ලබයි. එමෙන්ම මෙම අධ්‍යයනයේදී විශේෂ අවධානය සමාජය වෙත යොමුකරන ලද අතර සමාජය තුළ ඔවුන්ගේ මනෝභාවයන් හා ආකල්ප යන මනෝභාවත්මක පැතිකඩ පිළිබඳව සාකච්ඡා කරනු ලබයි.

### 1.8.2. භූගෝලීය සීමා (Geographical Limitation):

භූගෝලීය සීමා වශයෙන් ශ්‍රී ලංකාවට විශේෂිතව කොළඹ, කුරුණෑගල, ගාල්ල යන දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි ග්‍රාමීය, අර්ධ නාගරික, නාගරික ලෙස සමාජ විද්‍යාත්මක නියැදි ක්‍රමයක් තෝරාගනු ලබයි.

## 1.9. පර්යේෂණ න්‍යායික ක්‍රමවේදී පදනම:

මෙම අධ්‍යයනය සිදුකිරීමට අවශ්‍ය ප්‍රායෝගික හා න්‍යායාත්මක කරුණු විමර්ශනය කොට ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවබෝධයක් ලබාගැනීම මෙහි න්‍යායාත්මක පසුබිම සම්පාදනය කිරීමේ මුඛ්‍ය අරමුණ වේ. අවසානයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක වශයෙන් සම්පාදනය කරගනු ලබන දත්තයන් හා තොරතුරු විශ්ලේෂණය කොට සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා පිළිබඳ අධ්‍යයනය විධිමත්ව සම්පාදනය කොටගත් දත්ත හා තොරතුරු ඔස්සේ අවබෝධයක් ලබාගැනීම සිදු වේ. ඒ සඳහා ප්‍රාථමික දත්ත මෙන්ම ද්විතියික දත්ත ඔස්සේ ප්‍රධාන වශයෙන් කරුණු අධ්‍යයනය කිරීම සිදු කරනු ලබයි.

සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා පිළිබඳ අධ්‍යයනය කිරීම,

- මාක්ස්වාදී සන්නිවේදන ප්‍රවේශය
- සමාජ විද්‍යාත්මක සන්නිවේදන ප්‍රවේශය
- මනෝ විශ්ලේෂණවාදී න්‍යාය

- සංජානන න්‍යාය

යන න්‍යායාත්මක ප්‍රවේශයන් තුළින් යම්කිසි දේශපාලනික, සමාජ විද්‍යාත්මක හා මනෝ විශ්ලේෂණවාදී දර්ශනයන් ඔස්සේ විග්‍රහ කරනු ලබයි.

## 1.10. පර්යේෂණ මූලාශ්‍ර (Sources of the Research):

පර්යේෂණයක් සිදු කිරීමේදී ඊට අවශ්‍ය කරනු ලබන තොරතුරු හා දත්තයන් සම්පාදනය කරගත යුතුය. ඒ සඳහා මූලාශ්‍ර ඉතා වැදගත් වේ. නූතන ගුවන් විදුලිය තුළ සුභාවිත ගීත කෙරෙහි තරුණ ප්‍රජාවගේ ආකල්ප පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී න්‍යායික මෙන්ම ප්‍රයෝගික දත්ත ලබා ගැනීම සඳහා මූලාශ්‍ර පරිශීලනය කිරීම සිදුකරනු ලබයි. ඒ සඳහා ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර ද, සාහිත්‍ය විමර්ශනයේදී ලිඛිත මෙන්ම අලිඛිත මූලාශ්‍ර ද භාවිතයට ගනු ලබයි. මෙම පර්යේෂණය සඳහා යොදාගනු ලබන ද්විතියික මූලාශ්‍රයන් ලිඛිත හා අලිඛිත මූලාශ්‍රයන් ලෙස ප්‍රධාන වශයෙන් වර්ගීකරණය කරනු ලබයි.

### 1.10.1. ප්‍රාථමික මූලාශ්‍ර (Primary Sources):

සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා පිළිබඳ අධ්‍යයනය තුළින් නූතන ගුවන්විදුලිය තුළ සුභාවිත ගීතයට ලබාදී ඇති ඉඩ ප්‍රස්ථාව පිළිබඳ විමර්ශනය කරනු ලබන මෙම අධ්‍යයනයේදී සමකාලීන සංහතික මාධ්‍යයක් වන ගුවන්විදුලි මාධ්‍යයෙහි අන්තර්ගතයන් දත්ත ඒකරාශී කිරීමේ ප්‍රාථමික ක්‍රමවේදය ලෙස යොදාගැනීම සිදු කරනු ලබයි.

### 1.10.2. ද්විතියික මූලාශ්‍ර (Secondary Sources):

මෙම පර්යේෂණය සඳහා යොදාගනු ලබන ද්විතියික මූලාශ්‍රයන් ලිඛිත හා අලිඛිත මූලාශ්‍රයන් ලෙස ප්‍රධාන වශයෙන් වර්ගීකරණය කරනු ලබයි.

#### 1.10.2.1. ලිඛිත මූලාශ්‍ර:

විෂය සමගාමී ග්‍රන්ථ, සඟරා, අන්තර්ජාල වාර්තා, ජාත්‍යන්තර සඟරා සටහන් හා පර්යේෂණ පත්‍රිකා, විශ්වවිද්‍යාල හා ශාස්ත්‍රාලීය මට්ටමින් ලියවී ඇති ජාතික හා ජාත්‍යන්තර අප්‍රකාශිත පර්යේෂණ නිබන්ධන (International Journal and Research Paper), ශබ්දකෝෂ, විශ්වකෝෂ, පාඨ ග්‍රන්ථ හා පුවත්පත්, සඟරා, වෙබ් අඩවි ලිඛිත මූලාශ්‍රයන් යටතේ මෙම පර්යේෂණය සඳහා යොදාගනු ලබයි.

### 1.10.2.2. අලිඛිත මූලාශ්‍ර:

ද්විතියක දත්ත එක්රැස්කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණයන් හා දේශන යනාදී දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් භාවිත කිරීමට අපේක්ෂා කරනු ලබන අතර අපේක්ෂිත නියැදියට ප්‍රශ්නාවලියක් බෙදාදීම තුළින් රැස් කරගන්න ලද දත්ත හා තොරතුරු spss මෘදුකාංගය යොදාගනිමින් විශ්ලේෂණය කිරීම තුළින් අවසානයේ නිගමන හා යෝජනා වලට එළඹීමටත්, ඒ ඔස්සේ අදහස් දැක්වීමත් සිදු කරනු ලබයි.

## 1.11. පර්යේෂණ ක්‍රමවේදය (Methodology):

මෙම පර්යේෂණය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන දෙඅංශය තුළින් ම දත්ත එක්රැස් කිරීමට බලාපොරොත්තු වීම හේතුවෙන් මේ සඳහා මිශ්‍ර ක්‍රමවේදය (Mix Method) යොදාගැනීම සිදු කරනු ලැබිණි. එනම් න්‍යායාත්මක දත්ත හා මූලාශ්‍ර මෙන්ම පුද්ගලයින් 300කින් යුත් නියැදියක් මෙහිදී අධ්‍යයනය කෙරිණ. මෙම නියැදිය කොළඹ, කුරුණෑගල, ගාල්ල යන දිස්ත්‍රික්ක නියෝජනය වන ආකාරයෙන් නියැදිකරණයට යොමු කරනු ලබයි.

- ස්ත්‍රී පුරුෂභාවය
- අධ්‍යාපනික මට්ටම
- සමාජ තලය

යනාදියෙහි විවිධත්වය නියෝජනය වන පරිදි මාධ්‍ය සමඟ ගනුදෙනු කරන තරුණ පිරිසක් තෝරා ගන්නා අතර, ඔවුන්ගේ වයස, සමාජතල, රැකියා, අධ්‍යාපන, සංස්කෘතික වටපිටාව ආදී අංශ කෙරෙහි අවධානය යොමු කරමින් නියැදිය තෝරා ගැනීම සිදු කරනු ලබයි.

## 1.12. පර්යේෂණ නියැදිය (Research Sample):

ස්ත්‍රී පුරුෂභාවය, වයස, සමාජතල, රැකියා, අධ්‍යාපන, සංස්කෘතික වටපිටාව ආදී අංශ ආවරණය වීම සඳහා 300 දෙනෙකුගෙන් යුත් නියැදියක් උපයෝගී කර ගෙන එම නියැදිය වෙත ප්‍රශ්නාවලි ලබා දී දත්ත ලබා ගැනීම සිදු කරනු ලබයි. විශේෂයෙන්ම නියැදිය සඳහා මාධ්‍යවේදීන් උපයෝගී කර ගැනීමේදී එම මාධ්‍යවේදීන් මාධ්‍ය ක්ෂේත්‍රය හා සම්බන්ධ කාල ප්‍රමාණය මෙන්ම තනතුර පිළිබඳව ද සැලකිල්ලක් දැක්වීම සුවිශේෂීව පෙන්වා දිය යුතුය.

## 1.13. දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය (Data Collecting Methods):

දත්ත රැස්කිරීම සඳහා පහත සඳහන් ශිල්ප ක්‍රම භාවිතා කර තිබේ. එම ශිල්ප ක්‍රමයන් පහතින් දැක්වේ.

### 1.13.1. ප්‍රශ්නාවලිය (Technique of Questionaire)

දත්ත රැස් කිරීමේදී භාවිතා වන ප්‍රධාන ලේඛන ක්‍රමයක් වන මෙම ප්‍රශ්නාවලි ක්‍රමය විශාල ජන සංඛ්‍යාවකින් අඩු කාලයක් තුළදී දත්ත රැස්කිරීමේ ක්‍රමවේදයක් වන බැවින් මේ හරහා තොරතුරු ඒකරාශී කර ගැනීම සිදු කරන අතර, ඒ අනුව තෝරාගත් දිස්ත්‍රික්ක වල,

- ග්‍රාමීය
- නාගරික
- අර්ධ නාගරික

යන නියැදියන් තෝරා ගෙන ප්‍රශ්නාවලිය බෙදාහැර ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත රැස් කිරීම පර්යේෂණයේදී භාවිත කිරීම සිදු කරනු ලබයි.

### 1.13.2. සම්මුඛ සාකච්ඡා ක්‍රමය (Technique of Interviews)

මෙම පර්යේෂණයේ ගැටලුව නිරාකරණය කර ගැනීමට මෙන්ම ශ්‍රී ලංකාව සංහතික මාධ්‍ය හා සම්බන්ධ මෙන්ම ගුවන්විදුලි මාධ්‍යයට හා සමාජ විද්‍යාත්මක මෙන්ම මනෝ විද්‍යාත්මක යන ක්ෂේත්‍රයන්ට විශේෂිත බුද්ධිමතුන් ප්‍රවීණයින්, විද්වතුන්, න්‍යායාචාර්යවරුන් සමග සම්මුඛ සාකච්ඡා මගින් පර්යේෂණයේ ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීම සිදු කර තිබේ. විශේෂයෙන්ම අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා (Semi Structural Interviews) ක්‍රමයක් මේ සඳහා උපයෝගී කර ගැනීම අපේක්ෂා කරනු ලබයි.

### 1.13.3. නිරීක්ෂණය (Technique of Observation)

සමාජීය විද්‍යා විධික්‍රමය තුළ බහුලව භාවිතයට ගැනෙන ක්‍රම ශිල්පයක් වන නිරීක්ෂණය යනු ආනුභවික පර්යේෂණ ක්ෂේත්‍රයක අදාළ ප්‍රපංචය හෝ සංසිද්ධියට සාධක පාලනයකින් තොරව කරනු ලබන පරීක්ෂණයකි. ක්ෂේත්‍රයට මුසුවෙමින් හෝ ක්ෂේත්‍රයට පරිබාහිරව හිඳ සෘජුව හෝ වක්‍රව පර්යේෂණයට බඳුන්වන සංගහනය පිළිබඳ අධ්‍යයනය නිරීක්ෂණයේ ස්වභාවය වේ. ඒ අනුව සමාජයේ පුද්ගලයන්ගේ සාමාන්‍ය ජීවිතයේ යම් යම් තොරතුරු ලබා ගැනීම සඳහා භාවිතා වන්නකි. මේ හරහා පොදු නිගමන තහවුරු කිරීම සිදු කරනු ලබයි.

## 1.14. අන්තර්ගත විශ්ලේෂණය (Content Analysis) :

ශ්‍රව්‍ය දෘශ්‍ය පඨිතයන්, ලේඛන යනාදියෙහි සන්නිවේදන රටාවන් මෙන්ම සමාජ සංසිද්ධීන්හි අන්තර්ගත විශ්ලේෂණයන් පරීක්ෂා කිරීම සඳහා යොදාගනු ලබන මෙම පර්යේෂණ ක්‍රමය මගින්,

- එෆ්. එම් දෙරණ
- සිරස එෆ්. එම්
- රන් එෆ්. එම්
- ශ්‍රී එෆ්. එම්

යනාදී සමකාලීන ගුවන්විදුලි නාලිකා විමර්ශනය කරමින් සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා පිළිබඳ අධ්‍යයනය තුළ නූතන ගුවන්විදුලිය තුළ සුභාවිත ගීතයට ලබාදී ඇති ඉඩ ප්‍රස්ථාව පිළිබඳ අධ්‍යයනය කරනු ලබයි. මෙහිදී විශේෂයෙන්ම මාස 3ක කාලයක් තුළ එම නාලිකාවන්හි ප්‍රචාරය වන ගීත කුමනාකාරයේ ද, ඒ අතරින් සුභාවිත ගීත සඳහා ඉඩ ප්‍රස්ථාවක් ලබාදී ඇති වැඩසටහන් ආකෘති මොනවාද? එම වැඩසටහන් ආකෘති, විකාශන දිනය හා කාලය, තරුණ ප්‍රජාවගේ ආකල්පමය බලපෑම සඳහා ඒවායෙහි අන්තර්ගත ක්‍රමවේද හා ඒවා ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව විශ්ලේෂණයක් සිදු කරනු ලබයි.

## 1.15. දත්ත වර්ගීකරණය (Data Catorgorizing of Research) :

රැස් කරගත් දත්ත ඒ ඒ වර්ග අනුව බෙදා එහි අනුවර්ග වලටත් අනුවර්ග වල උපවර්ග වලටත් ආදී වශයෙන් වෙන් කරගැනීම දත්ත වර්ගීකරණයෙන් සිදුවේ. ලිඛිත මූලාශ්‍රයන් සහ අලිඛිත මූලාශ්‍රයන් මෙන්ම ප්‍රාථමික මූලාශ්‍රයන් සහ ද්විතීයික මූලාශ්‍රයන් හරහා ලබාගන්නා තොරතුරු, දත්ත පිඹුරු සටහනකට අනුව අංඛිත ක්‍රමයට වර්ග කිරීම මෙහිදී සිදු කරනු ලබයි. විශේෂයෙන්ම ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය හා නිරීක්ෂණ යන විශේෂිත දත්ත රැස්කිරීමේ ක්‍රමවේද යටතේ ඉදිරිපත් වූ න්‍යායාත්මක හා ප්‍රායෝගික දත්ත, විසම්මුතික අදහස් යනාදිය වර්ගීකරණය මෙහිදී සිදු කරනු ලබයි.

## 1.16. දත්ත විශ්ලේෂණය (Data Analysis) :

සමකාලීන ගුවන්විදුලි නාලිකා විමර්ශනය කරමින් සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා පිළිබඳ අධ්‍යයනය නම් මෙම අධ්‍යයනයෙහි පර්යේෂණ ගැටලුව (නූතන ගුවන්විදුලිය තුළ සුභාවිත ගීතයට ලබාදී ඇති ඉඩ ප්‍රස්ථාව කුමක්ද?) සහ උපන්‍යාසය අතර හේතු -ප්‍රත්‍ය සම්බන්ධතාවය විශ්ලේෂණය කිරීම ක්‍රමවේද ත්‍රිත්වයක් භාවිත කර එනම්,

1. ප්‍රමාණාත්මක විශ්ලේෂණය
2. ගුණාත්මක විශ්ලේෂණය
3. මිශ්‍ර ක්‍රමවේදය

ඔස්සේ මෙම දත්ත විශ්ලේෂණය කර දත්තවල අන්තර්ගතය කෙබඳුද යන්න පිළිබඳව අවධානය යොමු කර ඒ ඇසුරෙන් නිගමන හා යෝජනා ඉදිරිපත් කිරීම සිදු කරනු ලබයි. දත්ත විශ්ලේෂණය කිරීම සඳහා spss මෘදුකාංගය භාවිත කරනු ලබයි.

## 1.17.ආනුභාවික සාමාන්‍යකරණය (Empirical Genaralization) :

මෙහිදී පර්යේෂණය මගින් මෙතෙක් ගොඩනගා ගන්නා ලද දත්ත කොතෙක් දුරට විද්‍යාත්මක ද යන්න සොයා බැලීමට අදහස් කෙරේ. දත්තයන්හි වලංගුභාවය හා විශ්වාසනීයත්වය රැකෙන පරිදි මා විසින් ගොඩනගා ගන්නා ලද දත්ත මාගේ පර්යේෂණ ක්ෂේත්‍රයට සම්බන්ධ තවත් ක්ෂේත්‍රයක් සඳහා ආදේශ කර බැලීම සිදු කරනු ලබයි.

## 1.18. දත්ත සත්‍යාක්ෂණය (Data Testing and Empirical Generalization) :

ලබාගත් තොරතුරු ආනුභාවික දත්ත සාමාන්‍යකරණයට ලක්කර අදාළ ගුණාත්මක ශිල්පීය ක්‍රම අවශ්‍ය ලෙස භාවිත කරමින් විෂය ක්ෂේත්‍රට අදාළ ක්ෂේත්‍ර දත්ත නිවැරදිව සකසා ගැනීම සිදු කර, එසේ ගොඩනගාගන්නා ලද දත්ත සත්‍යාක්ෂණය කිරීම සිදු කරනු ලබයි. එහිදී දත්ත නිවැරදි බවින් තොර නම් නැවත දත්ත රැස්කරමින් පර්යේෂණය කිරීම සිදුකරයි. ඒ අනුව මෙම පර්යේෂණයට අදාළව සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා පිළිබඳ අධ්‍යයනය නම් මෙහි නූතන ගුවන්විදුලිය තුළ සුභාවිත ගීතයට ලබාදී ඇති ඉඩ ප්‍රස්ථාව පිළිබඳ අධ්‍යයනය සඳහා ඉදිරිපත් වූ දත්ත සත්‍යාක්ෂණය කිරීම සිදු කරනු ලබයි.

## 1.19. දත්ත භාවිතය (Utilization on of findings) :

සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා පිළිබඳ අධ්‍යයනය තුළින් නූතන ගුවන්විදුලිය තුළ සුභාවිත ගීතයට ලබාදී ඇති ඉඩ ප්‍රස්ථාව අධ්‍යයනය කිරීම පිළිබඳ විශ්ලේෂණය කිරීමට අපේක්ෂිත සමාජ විද්‍යා පර්යේෂණය අවසානයේ සොයා ගන්නා ලද දත්ත උපාධි නිබන්ධනයට

පමණක් සීමා නොකරමින් පාඨ ග්‍රන්ථයක් ලෙස එළිදැක්වීමෙන් ද සොයාගත් දත්ත සමාජය වෙනුවෙන් නිසි උපයෝජන සඳහා සැලසුම් කිරීමට හා උපයෝජනය කිරීමට ද අපේක්ෂා කරනු ලබයි. තව ද රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වලට සහ මෙම පර්යේෂණයට අදාළ ආයතන වලට දත්ත නෛතික පදනම මත ලබා දීමට කටයුතු කිරීමට ද අපේක්ෂා කර ඇත. එමෙන්ම සම්මන්ත්‍රණ පත්‍රිකා සහ සඟරා ආදිය සඳහා ලිපි මඟින් දත්ත ලබාදීමට කටයුතු කරනු ලබන අතර මෙම පර්යේෂණය ශ්‍රී ලංකාවේ අදාළ පුස්තකාල වලට ද ලබාදීම සිදු කර මෙවැනි පර්යේෂණ සිදු කිරීමට යෝජනා කරමින් නව බ්ලොග් අඩවියක් නිර්මාණය කර මෙම දැනුම සම්ප්‍රේෂණය කිරීමටත් බලාපොරොත්තු වේ.

## 1.20. පර්යේෂණ වාර්තාවේ දළ සැලැස්ම (Outline of the Research) :

1.20.1. මාතෘකාව - **සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා පිළිබඳ අධ්‍යයනය**

1.20.2. පළමුවැනි පරිච්ඡේදය - **හැඳින්වීම, ක්‍රමවේදය සහ මූලාශ්‍ර**

පළමුවැනි පරිච්ඡේදය තුළ සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා පිළිබඳ අධ්‍යයනය මාතෘකාව යටතේ දැක්වෙන පර්යේෂණය පිළිබඳව හඳුන්වා දෙමින්, ඒ පිළිබඳව මෙතෙක් ඇති තොරතුරු අධ්‍යයනය කරමින් තොරතුරු දැක්වීම සිදු කරනු ලබයි. නූතන ගුවන් විදුලිය තුළ සුභාවිත ගීතයට ලබාදී ඇති ඉඩ ප්‍රස්ථාව කුමක්ද? එය කෙතරම් ද? හා එම අවස්ථාවන් මොනවා ද? යන පර්යේෂණ ගැටලුව, අරමුණ හා අභිමතාර්ථ පිළිබඳ විශ්ලේෂණයක් අඩංගු වන අතර දත්ත රැස් කිරීමට යොදාගන්නා පර්යේෂණ ක්‍රමවේද පිළිබඳව විවරණයක යෙදේ. ඉදිරි පරිච්ඡේදයන්හි සාකච්ඡාවට බඳුන් වන අන්තර්ගත කරුණු පිළිබඳව ද විස්තර සංගෘහිත වේ.

1.20.3. දෙවැනි පරිච්ඡේදය - **සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා පිළිබඳ අධ්‍යයනය පිළිබඳ න්‍යායාත්මක විශ්ලේෂණය**

දෙවැනි පරිච්ඡේදය ඔස්සේ නූතන ගුවන් විදුලිය තුළ සුභාවිත ගීතයට ලබාදී ඇති ඉඩ ප්‍රස්ථාව කුමක්ද? සුභාවිත ගීතයට ඉඩ ප්‍රස්ථාවක් ලබාදී තිබේද? එය කෙතරම් ද? යන පර්යේෂණ ගැටලුව ඔස්සේ විමර්ශනය කරමින්, සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා පිළිබඳ න්‍යායාත්ම විශ්ලේෂණය හා හඳුනාගැනීම, සංගීතයේ අග්‍ර ඵලයක් ලෙස බිහිවූ ගීත කලාව තුළ සිංහල සුභාවිත ගීත කලාව හඳුනාගනිමින් නූතන ගුවන්විදුලි ගීත ශානර තුළ සුභාවිත ගීතයේ භූමිකාව විමසා බැලීම, සිංහල ගීත කලාව තුළ සුභාවිත ගීතය හඳුනාගැනීම, සමකාලීන ගුවන්විදුලි ගීත ශානර පද්ධතිය තුළ සුභාවිත ගීතය පිළිබඳව පවතින න්‍යායික සහ සංකල්පීය ප්‍රවේශ පිළිබඳව විමර්ශනය කිරීම, ගුවන්විදුලියේ ප්‍රචාරය වනු ලබන ගීත ශානර අතර ප්‍රමුඛව ඉඩ ප්‍රස්ථාව ලබාදෙන ගීත වර්ග හඳුනාගැනීම හා එයට අදාළ හේතු සහ කොන්දේසි විමර්ශනය කිරීම, සමකාලීන ගුවන්විදුලි ගීත ශානර ව්‍යුහය තුළ සුභාවිත ගීතයේ තත්වය විමසා බැලීම, 1924 වර්ෂයේ සිට අද දක්වා ගීතයෙන් පෝෂණය වන ගුවන්විදුලි නාලිකාවල විකාශනය අධ්‍යයනය කිරීම, තරුණ ප්‍රජාවගේ ආකල්ප වර්ධනය සඳහා සුභාවිත ගීතය මගින් කරනු ලබන බලපෑම කුමනාකාරද යන්න අධ්‍යයනය කිරීම යනාදී වශයෙන් වූ මෙම පර්යේෂණයට අදාළ අරමුණ හා අභිමතාර්ථ සාධනය වන ආකාරයෙන් සංකල්පික හා න්‍යායාත්මක ප්‍රවේශ ඔස්සේ කරුණු ගෙනහැර දැක්වීම සිදු කරනු ලබයි. සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා

අධ්‍යයනය පිළිබඳ න්‍යායාත්මක විශ්ලේෂණය, නූතන ගුවන්විදුලිය තුළ සුභාවිත ගීතයට ලබාදී ඇති ඉඩ ප්‍රස්ථාව අධ්‍යයනය පිළිබඳව න්‍යායාත්මක හා සංකල්පීය ප්‍රවේශය, නූතන ගුවන්විදුලිය තුළ සුභාවිත ගීතයට ලබාදී ඇති ඉඩ ප්‍රස්ථාව අධ්‍යයනය සාකච්ඡා කිරීම පිළිබඳ මාක්ස්වාදී සන්නිවේදන ප්‍රවේශය, සමාජ විද්‍යාත්මක සන්නිවේදන ප්‍රවේශය, මනෝ විශ්ලේෂණවාදී න්‍යාය හා සංජානන න්‍යාය, සන්නිවේදනය හා ගුවන්විදුලිය, ගුවන්විදුලි මාධ්‍ය හැඳින්වීම, ශ්‍රී ලංකාවේ ගුවන්විදුලි මාධ්‍යයේ ආරම්භය හා විකාශනය, සංගීතයේ ආරම්භය, සංගීත රසාස්වාදය යන්න හැඳින්වීම, ගීතය යන හැඳින්වීම, ගුවන්විදුලි ගීතය හැඳින්වීම, සුභාවිත ගීතය යනු කුමක්ද?, ගීතය සතු වූ සමාජ කාර්යභාරය, වර්තමාන ජනප්‍රිය ගීතය යනු කුමක්ද?, පෞද්ගලික ගුවන්විදුලි නාලිකා ආරම්භය හා විකාශනය, නූතන ගුවන්විදුලිය තුල සුභාවිත ගීතයට ලැබෙන ඉඩ ප්‍රස්ථාව, ගුවන්විදුලි ගීතයේ නව ප්‍රවණතා පිළිබඳව පළවූ විචාරක මත හා න්‍යායාත්මක හා සංකල්පික ප්‍රවේශගත නිගමනය පිළිබඳව න්‍යායාත්මක කරුණු මේ තුළ අන්තර්ගත වේ.

1.20.4. තෙවැනි පරිච්ඡේදය - **පර්යේෂණ ක්‍රමවේදය**

මෙහිදී විශේෂයෙන්ම පර්යේෂණයට අදාළ පර්යේෂණ ක්‍රමවේදයට (Research Method) හා පර්යේෂණ සැලැස්මට (Research Design) අනුව දැක්වෙන දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේද (Data Collecting Tools) ඔස්සේ දත්ත එක්රැස් කරගැනීමෙන් සපයා ගන්නා ලද දත්ත හා තොරතුරු පර්යේෂණයේ න්‍යායාත්මක හා ප්‍රයෝගික වපසරිය සකස් කරගැනීම සඳහා විධිමත් ලෙස යොදාගැනීම සිදුකරනු ලබයි. මෙම පර්යේෂණයට උචිත වන පරිදි මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ අධ්‍යයනයට අනුව ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණය මෙන්ම අන්තර්ගත විශ්ලේෂණය යනාදී ක්‍රමයන්ට අනුව නූතන ගුවන්විදුලිය තුළ සුභාවිත ගීතයට ලබාදී ඇති ඉඩ ප්‍රස්ථාව පිළිබඳ අධ්‍යයනය සිදු කරනු ලබයි.

1.20.5. සිව්වැනි පරිච්ඡේදය - **පර්යේෂණ මාතෘකාව පිළිබඳ න්‍යායාත්මක විශ්ලේෂණය**

සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා පිළිබඳ අධ්‍යයනය පිළිබඳ විශ්ලේෂණය කිරීම මෙහිදී සිදුවේ. මෙහිදී අද්‍යතන ගුවන්විදුලි මාධ්‍ය ක්‍රියාකාරීත්වය නාලිකා කිහිපයක් ඔස්සේ විශ්ලේෂණය, සිදු කරනු ලබයි.

1.20.6. පස්වැනි පරිච්ඡේදය - **දත්ත විශ්ලේෂණය**

පර්යේෂණය සිදුකිරීමට යෝග්‍ය වන පරිදි සකසා ගත් මිශ්‍ර ක්‍රමවේදයට (Mix Method) අදාළ දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් වන නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නවලි හා අන්තර්ගත විශ්ලේෂණය තුළින් ලබාගත් ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත ආශ්‍රයෙන් විශ්ලේෂණය කිරීම මෙම පරිච්ඡේදය තුළ සිදු කරනු ලබයි. විශේෂයෙන් මෙම දත්ත විශ්ලේෂණ ක්‍රියාවලිය සඳහා spss මෘදුකාංගය භාවිත කරනු ලබයි.

1.20.7. සයවැනි පරිච්ඡේදය - **නිගමන, යෝජනා, නිර්දේශ**

ඉහත පරිච්ඡේදවලදී සාකච්ඡා වූ කරුණු සාරාංශ කිරීම හා එහිදී මතු වූ ගැටලු පිළිබඳ නිගමන, යෝජනා හා නිර්දේශයන් ද ඉදිරිපත් කිරීම මෙහි ප්‍රධාන අරමුණ බවට පත් වේ. එනම් කාලීන වැදගත්කමින් යුතු මෙම අධ්‍යයනයට අවශ්‍ය නිගමන, යෝජනා, නිර්දේශ ඉදිරිපත් කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

1.21. අයවැය ලේඛනය

1.22 . පූර්ව සාහිත්‍ය විමර්ශනය

1.23 ආශ්‍රිත ග්‍රන්ථ

පර්යේෂණය සිදු කිරීමේදී භාවිත කරන ලද පාඨ ග්‍රන්ථ, පර්යේෂණ පත්‍රිකා ඇතුළු සියලුම ලිඛිත හා අලිඛිත මූලාශ්‍ර පිළිවෙලින් මේ තුළ අන්තර්ගත වේ.

## 1.21. අයවැය ලේඛනය (Budget)

පර්යේෂණය සඳහා වැයවන සමස්ත මුදල.

| අයිතමය | මුදල | එකතුව |
|---|---|---|
| **පර්යේෂණයේ පූර්ව සූදානම** | රුපියල් | රුපියල් |
| ලිපි ද්‍රව්‍ය | 3,000.00 | |
| දුරකතන ගාස්තු | 4,000.00 | |
| මුද්‍රිත පිටපත් | 3,000.00 | |
| ප්‍රවාහන ගාස්තු | 4,000.00 | |
| ඡායා පිටපත් | 1,000.00 | |
| වෙනත් වියදම් | 2,000.00 | |
| එකතුව | 16,000.00 | 16,000.00 |
| **ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්** | | |
| සහය පර්යේෂකවරු පුහුණු කිරීම | 25,000.00 | |
| මඟ පෙන්වන්නන් සඳහා | 8,000.00 | |
| ඡායා පිටපත් | 2,000.00 | |
| සපමිත් දායකයින් හමුවීම ඇතුළු ප්‍රවාහන වියදම් | 20,000.00 | |
| දුරකතන ගාස්තු | 3,000.00 | |
| ලිපි ද්‍රව්‍ය | 3,000.00 | |
| වෙනත් වියදම් | 10,000.00 | |
| එකතුව | 71,000.00 | 71,000.00 |
| **සංස්කරණ කටයුතු** | | |
| ලිපි ද්‍රව්‍ය | 3,000.00 | |
| මුද්‍රණය | 20,000.00 | |
| පොත් බැඳීම | 10,000.00 | |
| එකතුව | 33,000.00 | 33,000.00 |
| **මුළු එකතුව** | **120,000.00** | **120,000.00** |

## 1.22 . පූර්ව සාහිත්‍ය විමර්ශනය (Literature Review):

**හැඳින්වීම**

පර්යේෂණය යන සිංහල පදයට පර්යාය වූ ඉංග්‍රීසි පදය වන Research යන්න ව්‍යුත්පන්න වූයේ මධ්‍යකාලීන ප්‍රංශ පදයක් වූ re-cherche සහ එහි පැරණි පදය වූ recerchier යන්නෙනි. එම සංයුක්ත පදයෙහි re යනු "සූක්ෂමව" වීමත් cerchier යන්නෙහි අදහස "සෙවීම" යන්න වීමත් අනුව "සූක්ෂමව සෙවීම" යනු එහි මූලික අර්ථය වේ. එහි පර්යේෂණ සාහිත්‍ය විමර්ශනයෙන් සිදු කරනු ලබන්නේ පවත්නා දැනුම සොයයාමක් වන අතර එහිදී න්‍යායපාදක වූ ගැටළු හඳුනාගෙන පර්යේෂණවලින් මෙතෙක් අනාවරණය වී ඇති කරුණු පිළිබඳව පවතින්න වූ මත, හා අදහස් සමතයකට පත්කර නිවැරදි ක්‍රම ශිල්ප සඳහා ගමන් කිරීමයි. උක්ත පර්යේෂණ මාතෘකාවට අදාළව සිදු කරන ලද පූර්ව සාහිත්‍ය විමර්ශනය තුළින් තහවුරු වූ කරුණක් වූයේ ඒ සම්බන්ධයෙන් විධිමත් පර්යේෂණයන් ද එවැනි ප්‍රාමාණික ශාස්ත්‍රීය අධ්‍යයනයන් මේ වනවිට ජාතික වශයෙන් සිදුවී තිබීම අවම මට්ටමක පවතින බවයි. එම පර්යේෂණ තුළින් අනාවරණය වන යම් න්‍යායාත්මක හා සංකල්පීය විශ්ලේෂණයන් මෙම අධ්‍යයනය සඳහා අදාළ වන අතර ඒ ඔස්සේ ගොඩනගන ලද යම් ක්‍රමවේදයන් මෙම පර්යේෂණයට යොදා ගැනීමට බලාපොරොත්තු වේ. එමෙන්ම මෙම පර්යේෂණයට අවශ්‍ය න්‍යායාත්මක පසුබිම සකස් කරගැනීමෙහි ලා නිර්දිෂ්ට මාතෘකාවට සෘජු ලෙසම සම්බන්ධ වන්නාවූ ශාස්ත්‍රීය පර්යේෂණ විරල වූ ස්වභාවයක පැවතීම නිසා පර්යේෂණ පත්‍රිකා, පර්යේෂණ ග්‍රන්ථ හා කෘතීන් කිහිපයක දායකත්වය සපයා ගත් අතර නිර්දිෂ්ට මාතෘකාවට අදාළත්වයක් උසුලන්නා වූ එම මූලාශ්‍රයන් පිළිබඳව පහත පරිදි පෙන්වාදිය හැකිය.

සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේද්‍ය විශේෂතා නම් මෙම අධ්‍යයනය සඳහා නිව්ටන් ගුණසේකර විසින් 2015 වර්ෂයේදී රචිත ගුවන්විදුලිය සහ මාධ්‍ය අධ්‍යයනය නම් ග්‍රන්ථය මූලාශ්‍රමය වශයෙන් යොදාගනු ලබයි. මෙහිදී ගුවන්විදුලි මාධ්‍ය හා ගීත ශානරය යන්න මෙම අධ්‍යයනය තුළින් විමර්ශනයට ලක්වන ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් ද්විත්වයක් වීම හේතුවෙන් මෙම ග්‍රන්ථය ඉතා වැදගත් වන බව පෙන්වා දිය යුතුය. මෙම ග්‍රන්ථය පරිශීලනය කිරීම තුළින් ශබ්ද මාධ්‍යයේ මුල් පියවරේ සිට ගුවන්විදුලි මාධ්‍ය ක්‍රියාවලිය හා නැගීම, සන්නිවේදන ක්‍රියාවලියේ විශේෂතා, ශ්‍රී ලංකා ගුවන්විදුලියේ ආරම්භය හා වර්තමානය මෙන්ම සුවිශේෂීතා පිළිබඳවත් නිවේදක කාර්යභාරය පිළිබඳවත් පුළුල් ලෙස න්‍යායාත්මක කරුණු ලබාගැනීමට හැකිවීම පෙන්වා දිය යුතුය.

` ලලිත් ප්‍රියදර්ශන දයාරත්න විසින් 2007 වර්ෂයේදී රචිත ගී රස විනිස නම් කෘතිය මෙම අධ්‍යයනය සඳහා මූලාශ්‍රමය වශයෙන් යොදාගනු ලබයි. මෙහිදී ගුවන්විදුලි ගීත ශානරය මූලික වන මෙම අධ්‍යයනය තුළ සුභාවිත ගීතය පිළිබඳව විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමේ මූලික කාර්යභාරය මත ගීත පිළිබඳව වූ න්‍යායාත්මක අවබෝධය අත්‍යවශ්‍ය වේ. ගී රස විනිස තුළින් කලාවේ ප්‍රභවය හා විකාශනය පිළිබඳවත් ඉන් අනතුරුව ගීතයේ ප්‍රභවය හා විකාශනය වීමත්, සංගීතයේ ප්‍රභේද, අපරදිග හා

පෙරදිග සංගීතයේ ප්‍රභවය හා විකාශනය මෙන්ම මෙම අධ්‍යයනයට ඉතා වැදගත් වන දේශීය සංගීතයේ අක්මුල් සොයායාම පිළිබඳව පුළුල්ව විමර්ශනය කොට සපයා ඇති න්‍යායාත්මක කරුණු මේ සඳහා ඉවහල් වන බව පෙන්වා දිය යුතුය.

ඉරංගා සමින්දනී වීරක්කොඩි විසින් 2008 වර්ෂයේදී ප්‍රථම මුද්‍රණය ලෙස ඉදිරිපත් කරන ලද ගුවන්විදුලිය හා සංගීතය නම් මෙම කෘතිය මෙම අධ්‍යයනය සඳහා සමීප සම්බන්ධතාවයක් දක්වන බව පෙන්වා දිය යුතුය. මෙහිදී ප්‍රථමයෙන් ගුවන්විදුලිය සහ සන්නිවේදනය පිළිබඳව න්‍යායාත්මක කරුණු සම්පාදනය කරගැනීමත්, ගුවන්විදුලි ග්‍රාහකයා පිළිබඳව අවබෝධාත්මක වීමටටත් මෙම කෘතිය යොදාගනු ලබයි. එමෙන්ම මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන අධ්‍යයන ක්ෂේත්‍රයක් වන ගුවන්විදුලි ගීතය අර්ථාන්විතව හඳුනාගැනීම, විශ්ව කලාවක් ලෙස එහි පවතින වැදගත්කම හඳුනාගැනීම, ගීතයේ කාර්යත්‍රයන් හඳුනාගැනීම හා මෙම අධ්‍යයනයෙහි න්‍යායාත්මක කරුණු සඳහා යොදාගැනීමට උපයෝගී වූ බව පෙන්වා දිය යුතුය.

2015 වර්ෂයේදී කළණි ඉරෝෂා ධර්මසිරි විසින් රචනා කර ප්‍රකාශයට පත් කරන ලද ගුවන්විදුලි මාධ්‍ය වැඩසටහන් නිෂ්පාදන ප්‍රවේශයන් පිළිබඳවත්, එහි ස්වභාවය පිළිබඳවත්, සමකාලීන ශ්‍රී ලාංකේය ගුවන්විදුලියේ රාජ්‍ය හා පෞද්ගලික අංශ ද්විත්වයේ ගුවන්විදුලි මාධ්‍ය ක්‍රියාකාරීත්වය හා එහි වැඩසටහන් නිෂ්පාදනය මෙන්ම ගුවන්විදුලි මාධ්‍යයක පවතින පොදු පරමාර්ථයන් පිළිබඳව කරන ලද විශ්ලේෂණයන් තුළින් න්‍යායාත්මක දත්ත රැස් කිරීම සිදු කරනු ලබයි. එමෙන්ම ගුවන්විදුලි සන්නිවේදනය සහ එහි අන්තර් ක්‍රියාවලිය පිළිබඳව මෙම කෘතියෙහි දක්වා ඇති න්‍යායාත්මක කරුණු ඇසුරින් ප්‍රබල ශබ්ද මාධ්‍යයක් ලෙස හඳුන්වා දී ඇති ගුවන්විදුලි සංගීතය තුළ ගුවන්විදුලි ගීත ප්‍රචාරණය පිළිබඳව නිදර්ශනාත්මකව දක්වා ඇති කරුණු මෙම පර්යේෂණයේ සාහිත්‍ය විමර්ශනය පෝෂණය කිරීමෙහි ලා වඩාත් වැදගත් වන බව පෙන්වා දිය යුතුය.

තිස්ස කාරියවසම් විසින් 2005 වර්ෂයේදී ප්‍රථම මුද්‍රණය ලෙසත්, 2012 වර්ෂයේ තෙවැනි මුද්‍රණය ලෙසත් ප්‍රකාශයට පත් කරන ලද ගුවන්විදුලි මාධ්‍ය යනු පර්යේෂණ කෘතිය තුළින් ගුවන්විදුලිය පිළිබඳව පෘථුලව සාකච්ඡා කරනු ලබයි. එහිදී ගුවන්විදුලි සන්නිවේදනය සතු පාද තුන වන භාෂණය, ශබ්ද ප්‍රයෝග හා සංගීතය තුළින් මෙම අධ්‍යයනය සඳහා වඩාත් වැදගත් ක්ෂේත්‍රයක් වන සංගීතයෙහි ස්වරූපය පිළිබඳවත් අධ්‍යයනය සිදු කර අනාවරණය කර ඇති දත්ත මී සඳහා යොදාගැනීම වඩාත් උචිත වූ බව පෙන්වා දිය යුතුය.

ශ්‍රීපාලි වයමන් විසින් 2000 වර්ෂයේදී රචනා කරන ලද ගුවන්විදුලිය හා එහි ක්‍රියාකාරීත්වය යන කෘතිය ගුවන්විදුලි ඉතිහාසය, ගුවන්විදුලි ප්‍රචාරය, ගුවන්විදුලි වැඩසටහන් නිෂ්පාදනකරණය පිළිබඳවත්, ගුවන්විදුලියක අන්තර්ගත ක්‍රියාවලිය සඳහා අවශ්‍යවන උපකරණ පිළිබඳව හඳුන්වා දී තිබීමත් මෙම අධ්‍යයනය සඳහා වැදගත්වීම පෙන්වා දිය හැකිවන්නේ මෙහි න්‍යායාත්මක කරුණු මෙන්ම ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය පිළිබඳව ද උචිත කරුණු උකහා ගැනීමට හැකිවීමෙනි. මෙහිදී විශේෂයෙන්ම ගුවන්විදුලි වැඩසටහන් ශානර අතර සංගීතමය වැඩසටහන් ශානරය පිළිබඳව දක්වා ඇති කරුණු මෙම අධ්‍යයනය සඳහා වඩාත් උචිත ලෙස සාහිත්‍ය විමර්ශනය ඔස්සේ යොදාගැනීම පෙන්වා දිය යුතුය.

සජිතා ලක්මාලි විසින් 2010 වර්ෂයේදී රචනා කරන ලද ඩිජිටල් යුගය අභියස ගුවන්විදුලියේ ඉරණ නම් කෘතිය තුළ සමකාලීන ගුවන්විදුලි ගීත ශානරයේ සන්නිවේදා විශේෂතා පිළිබඳ අධ්‍යයනය නම් මෙම පර්යේෂණයේ පූර්ව සාහිත්‍ය විමර්ශනය සඳහා වැදගත් වූ කාලීන කෘතියක් වන අතර මානව සන්නිවේදනයේ ආරම්භය, ගුවන්විදුලි මාධ්‍යයේ බිහිවීම, ගුවන්විදුලි මාධ්‍ය විශේෂතා යනාදී වශයෙන් කලානුරූපිව සිදු වූ ගොඩනැගීම පිළිබඳව දක්වා ඇති කරුණු මෙම අධ්‍යයනය සඳහා යොදාගන්නා බව පෙන්වා දිය හැකිය.

මීට අමතරව වෙබ් අඩවි බ්ලොග් අඩවි තුළින් ද ලබාගන්නා ලද න්‍යායාත්මක දත්තයන් මෙම පර්යේෂණ සඳහා යොදාගනු ලබන අතර මෙම පර්යේෂණයේදී සාහිත්‍ය විමර්ශනය ඔස්සේ ගෙනහැර දැක්වීමට බලාපොරොත්තු වේ.

## 1.23. ආශ්‍රිත ග්‍රන්ථ (Referance):


අබේපාල ආර්. (2004). *සෞන්දර්ය අධ්‍යාපන විවරණය*, කොට්ටාව, සාර ප්‍රකාශන.

කාරියවසම් ටී. (2012). *ගුවන්විදුලි මාධ්‍යය යනු*, කොළඹ 10, චතුර මුද්‍රණාලය.

ගම්ලත් එස්. (1997). *රසවාද විවරණය*, කොළඹ, එස් ගොඩගේ සහ සහෝදරයෝ.

ගුණසේකර එන්. (2015). *ගුවන්විදුලිය සහ මාධ්‍ය අධ්‍යයනය*, කොළඹ 10, ෆාස්ට් ප්‍රින්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්.

දයාරත්න එල්. පී. (2007). *ගී රස විනිස,* කොළඹ 10, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ධර්මසිරි කේ. අයි. (2015). *ගුවන්විදුලි මාධ්‍යය වැඩසටහන් නිෂ්පාදන ප්‍රවේශය*, කොළඹ 10, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ලක්මාලි එස්. (2010). *ඩිජිටල් යුගය අභියස ගුවන්විදුලියේ ඉරණම,* මැජෙස්ටික් ප්‍රින්ටර්ස්.

වයමන් එස්. (1992).*ගුවන්විදුලිය හා එහි ක්‍රියාකාරීත්වය,* කොළඹ 02, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථා ප්‍රකාශන

වීරක්කොඩි අයි. එස්. (2008). *ගුවන්විදුලිය සහ සංගීතය,* මහරගම, තරංජි ප්‍රින්ට්ස්.

**වෙබ් සහ බ්ලොග් අඩවි**


අසංගිකා කේ.පී.එස්. (2019). *නූතන ගීත රසවින්දනය හා සමාජ සංස්කෘතික විපරිණාමය පිළිබඳ සමාජ විද්‍යාත්මක විමසුමක්,* , Retrived from https://lankapress.com

*කරුණාරත්න කේ. 2019 "කැණීමඩලේ ගීතය" නූතන සුභාවිත හෙළ ගී කෙත* Retrived from www.silumina.lk

කුමාර එන්. එන්. (2020). *සුභාවිත ගී හා පොදු ජන ගී,* Retrived from http://www.sarasaviya.lk